Sri Lanka Computer Emergency Readiness Team | Coordination Centre

ශ්‍රී ලංකා CERT හි ඇබෑර්තු

ප්‍රධාන විධායක නිලධාරී

2006 වසරේදී පිහිටුවන ලද ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT) යනු ශ්‍රී ලංකාවේ ජාතික CERT ආයතනය වන අතර, එය ඩිජිටල් ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

සයිබර් ආරක්ෂණ තර්ජන වැළැක්වීම, හඳුනා ගැනීම සහ විසඳීම සඳහා වන ප්‍රමුඛතම ජාතික ආයතනය ලෙස ශ්‍රී ලංකා CERT ආයතනය පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා, ප්‍රධාන විධායක නිලධාරීවරයා (CEO) වසින් ආයතනය කළමනාකරණය කිරීම, මහජෙන්වීම සහ මෙහවාදී නායකත්වය සැපයීම, ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධතා පැවැත්වීම සහ අනෙකුත් සියලුම අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කළ යුතුය.

ප්‍රධාන වගකීම් සහ බැඳීම් :

- පාලක මණ්ඩලය විසින් තියම් කරනු ලබන උපායමාර්ගික මහජෙන්වීම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරීම.
- සංවිධානයේ සයිබර් ආරක්ෂණ ප්‍රයත්නයන් සඳහා සමස්ත මහජෙන්වීම, දැක්ම සහ ඉලක්ක සකස් කරමින්, CERT කණ්ඩායමට උපායමාර්ගික නායකත්වය සැපයීම.
- සම්පත් කළමනාකරණය, අයවැයකරණය සහ සිදුවීම් සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා සේවකයින් සහ තාක්ෂණය කාර්යක්ෂමව යෙදවීම ඇතුළුව, CERT හි දෛනික මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම.
- දත්ත අනවසරයෙන් ලබාගැනීම් (data breaches), අනිෂ්ට මෘදුකාංග ආසාදන (malware infections) සහ සයිබර් ප්‍රහාර වැනි සයිබර් ආරක්ෂණ සිදුවීම් ඵලදායී ලෙස හඳුනා ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා වන සිදුවීම් ප්‍රතිචාර සැලසුම් සහ ක්‍රියාපටිපාටි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරීම.
- සයිබර් ආරක්ෂණ සිදුවීම් සඳහා වන ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීමට සහ තර්ජන පිළිබඳ බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමට රජයේ ආයතන, නීතිය ක්‍රියාත්මක කරන ආයතන, කර්මාන්ත ක්ෂේත්‍රයේ හවුල්කරුවන් සහ අනෙකුත් CERT ආයතන ඇතුළු අභ්‍යන්තර කණ්ඩායම් සහ බාහිර පාර්ශවකරුවන් සමග සම්පව කටයුතු කිරීම.
- හොඳම ආරක්ෂණ භාවිතයන් ක්‍රියාත්මක කිරීම, අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීම සහ නිරණාත්මක වත්කම් සහ දත්ත ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂණ පාලන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම ඇතුළුව සයිබර් ආරක්ෂණ අවදානම් තක්සේරු කිරීම සහ එම අවදානම් අවම කිරීම සඳහා වන උපායමාර්ග සකස් කිරීම (මිට).
- අදාළ නීති, රෙගුලාසි සහ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල වන සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම සඳහා නීතිමය සහ නියාමන කණ්ඩායම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම.
- සේවකයින් සහ පාර්ශවකරුවන් සයිබර් ආරක්ෂණ හොඳම භාවිතයන්, තර්ජන සහ සිදුවීම් සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම සඳහා සයිබර් ආරක්ෂණ දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.
- සයිබර් ආරක්ෂණ සිදුවීම්, ප්‍රතිචාර දක්වීමේ ප්‍රයත්නයන් සහ අවම කිරීමේ උපාය මාර්ග පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, මණ්ඩල සාමාජිකයින්, පාර්ශවකරුවන් සහ මහජනතාව සමග සන්නිවේදනය කරමින් CERT හි ප්‍රධාන ප්‍රකාශකයා ලෙස කටයුතු කිරීම.
- CERT ආයතනය තුළ අඛණ්ඩ වැඩදියුණු වීමේ සංස්කෘතියක් ඇති කිරීම, වෙනස් වන සයිබර් තර්ජන සහ සංවිධානාත්මක අවශ්‍යතාවලට අනුකූල වන පරිදි සිදුවීම් ප්‍රතිචාර සැලසුම්, ක්‍රියා පටිපාටි සහ තාක්ෂණයන් නිතිපතා සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- ශ්‍රී ලංකා CERTහි මාර්ගෝපදේශයන්ට අනුකූලව රජය සහ අනෙකුත් පාර්ශවකරුවන් සමග සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම.
- මතුවන තර්ජනවලට මුහුණ දීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කිරීම සහ ජාතික සයිබර් ආරක්ෂණ වැඩපිළිවල ඉදිරියට ගෙන යාම සඳහා රජයේ ජ්‍යෙෂ්ඨ පාර්ශවකරුවන්ට බලපෑම් කිරීම ඇතුළුව, සයිබර් ආරක්ෂණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ පූර්ණ වගකීම දැරීම.
- ජාත්‍යන්තර ආරක්ෂක ජාල සමග සබඳතා පැවැත්වීම සහ බුද්ධි තොරතුරු මෙන්ම හොඳම භාවිතයන් හුවමාරු කර ගැනීම සඳහා හවුල්කාරිත්වයන් ගොඩනැඟීම.
- ප්‍රතිඵල ලබා කර ගැනීම සඳහා ක්‍රියාකාරීත්වය මුල් කරගත් සංස්කෘතියක් ඇති කිරීම සහ සුදුසු සේවක සහභාගීත්වයන් හරහා ධනාත්මක සහ අභිප්‍රේරිත සේවක මණ්ඩලයක් සහතික කිරීම.
- ක්ෂේත්‍ර මට්ටමේ සහ ආයතනික මට්ටමේ පරිගණක සිදුවීම් ප්‍රතිචාර කණ්ඩායම් (CSIRTs) පිහිටුවීම සඳහා මහජෙන්වීම, දිරිමත් කිරීම සහ සහාය වීම.
- ආසියා පැසිෆික් CERT (Asia Pacific CERT), FIRST (Forum for Incident Response and Security Teams) සහ අනෙකුත් රටවල ජාතික CERT ආයතන සඳහා වන ජාතික සම්බන්ධතා මධ්‍යස්ථානය ලෙස අඛණ්ඩව කටයුතු කරමින් ගෝලීය සහ කලාපීය සහයෝගිතාව සහතික කිරීම.

සුදුසුකම් සහ පළපුරුද්ද :

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් තොරතුරු ආරක්ෂණය, සයිබර් ආරක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධියක් (SLQF 5 හෝ 6)

සහ

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව, තොරතුරු ආරක්ෂණය, සයිබර් ආරක්ෂණය, පරිගණක ඉංජිනේරු විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයකින් ලබාගත් පශ්චාත් උපාධියක් (මාස්ටර් උපාධියක් - SLQF 9 හෝ ඊට ඉහළ) හෝ තොරතුරු ආරක්ෂණය, සයිබර් ආරක්ෂණය, පරිගණක විද්‍යාව යන ක්ෂේත්‍රවල පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත/ අධි සාමාජිකත්වය .

සමග

- පළමු උපාධිය ලැබීමෙන් පසු, පිළිගත් පුද්ගලික අංශයේ සයිබර් ආරක්ෂණ සේවා සපයන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, සම්පූර්ණයෙන්ම රජයට අයත් සමාගමක හෝ පිළිගත් වාණිජ ආයතනයක උපායමාර්ගික ශාඛාවල හැසිරවීමේ සාක්ෂි සහිතව, සාර්ථක ප්‍රතිපත්තිමය නායකත්වයක් සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තනතුරක වසර 05 ක පළපුරුද්ද ඇතුළුව, තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ක්ෂේත්‍රයේ වසර 14 ක හෝ ඊට වැඩි ක්ෂේත්‍ර පළපුරුද්දක් තිබීම.

විවිධ කුසලතාවන්ට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය :

- රජයේ නිලධාරීන්, ක්ෂේත්‍රයේ ප්‍රමුඛයින් සහ නාක්ෂණික විශේෂඥයින් ඇතුළු විවිධ පාර්ශවකරුවන් සමග ඵලදායී ලෙස කටයුතු කිරීමේ හැකියාව.
- උපායමාර්ගික සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඔප්පු කරන ලද පළපුරුද්ද.
- සයිබර් ආරක්ෂණ මූලධර්ම, භාවිතයන් සහ ගෝලීය තර්ජන හු දර්ශනය පිළිබඳ මනා අවබෝධය.
- විශිෂ්ට නායකත්ව, සංවිධානාත්මක සහ තීරණ ගැනීමේ කුසලතා.
- සුවිශේෂී සන්නිවේදන සහ අන්තර් පුද්ගල සම්බන්ධතා කුසලතා.
- ශක්තිමත් මූල්‍ය ඥානය සහ අයවැය මෙන්ම මූල්‍ය සම්පත් කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද.
- උසස් සදාචාරාත්මක ප්‍රමිතීන් සහ අවංකභාවය.

අනෙකුත් සාමාන්‍ය සුදුසුකම් :

අයදුම්කරුවන් පහත සඳහන් සාමාන්‍ය අවශ්‍යතා සපුරාලිය යුතුය :

- වයස අවුරුදු 40 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි මනාව ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහළ මට්ටමේ ජාතික ආයතන, ජාත්‍යන්තර ආයතන සහ විදේශීය අනෙකුත් ආයතන සමග අන්තර් ක්‍රියා කිරීම රැකියාවේ අවශ්‍යතාවයක් ලැවින් ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ භාෂාවන් පිළිබඳ මනා නිපුණතාවයක් තිබිය යුතුය.
- තොරතුරු ආරක්ෂණයට අදාළ තොරතුරු තාක්ෂණයේ (IT) ගෝලීය ප්‍රවණතා, සයිබර් ආරක්ෂණ ක්ෂේත්‍රයේ නවතම වර්ධනයන්, ඩිජිටල්කරණය ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීමේ ජාතික ප්‍රමුඛතා සහ ඒ ආශ්‍රිත දැනුම පිළිබඳ හුරුපුරුදු බව අමතර වාසියක් වනු ඇත.

වැටුප් වත්මන් ක්ෂේත්‍ර ප්‍රමිතීන්ට අනුව තීරණය වන අතර, ඊට අමතරව විදේශ සංචාර සහ වෘත්තීය දියුණු කිරීමේ අවස්ථා රාශියක් සමග ප්‍රවාහන දීමනාවක් ද ඇතුළත් වේ.

ඔබ මෙම තනතුර සඳහා සුදුසුම අපේක්ෂකයා බව විශ්වාස කරන්නේ නම්, ඔබගේ මැතකදී ගත් ජායාරූපයක් සහ ඥාතීන් නොවන තිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර සහිත ජීව දත්ත පත්‍රිකාව , විෂය තිරයේ "Chief Executive Officer" ලෙස සඳහන් කරමින්, 2026 ජූලි 27 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි careers@cert.gov.lk වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න. කෙටි ලැයිස්තුගත කරන ලද අපේක්ෂකයින්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

සභාපති,
ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT),
කාමර අංක 4-112, BMICH, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකථන : 011 2691692 / 011 2679888